
**නිවස සරසන විසිතුරු පැළ**



**ඇන්තුරියම් සඳහා 30ම කි අඩු උෂ්ණත්වයක්ද, 75% ක් තරම් සෙවනක්ද, 70% ක තරම් ආර්ද්‍රතාවක්ද තිබිය යුතු අතර ජල සැපයුම නිරතුරුව ලැබිය යුතුයි. වගා කිරීම සඳහා දිරාගිය කොළ පොහොර කොටස් දෙකක්, වියළි ගොම කොටස් එකක් හා වැලි කොටස් බාගයක් එකතු කර තැනූ මිශ්‍රණයක් යෝග්‍යවේ.**

# පත්‍රික ඇන්තූරියම්

ඇන්තූරියම් නම වඩා ප්‍රකටව ඇත්තේ අලංකාර මල් හට ගන්නා ශාක ප්‍රභේදයක් ලෙසිනි. නමුත් විසිතුරු පත්‍ර සහිත පැළ ලෙස වගාකර ගත හැකි ඇන්තුරියම් වර්ග රාශියක්ද ඇත. පත්‍රවල විවිධ හැඩයන්, ප්‍රමාණයන් ඒවා සැකසී ඇති රටාවන්, පත්‍රවල පිහිටි විවිධ රේඛීය මෝස්තරත් නිසා මේවා ප්‍රභේද රාශියකට බෙදෙන අතර ගෙවතු අලංකරණයේදී ප්‍රමුඛ ස්ථානයක් ගන්නා වර්ග ගණනාවක්ම ඒවා අතර වේ.

පත්‍රික ඇන්තුරියම් වගා කිරීමේදී මල සඳහා වගා කරන ඇන්තුරියම්වලට යොදන උපක්‍රම එලෙසින්ම භාවිතා කළ හැකියි. ගෙවත්තේ අලංකරණය සඳහා පත්‍රික ඇන්තුරියම් වගා කිරීමේදී ඒවා බඳුන් තුළ වගා කිරීම වඩා යෝග්‍යවේ.

බඳුනෙහි පතුලේ සිදුර මත කැඩුණු මැටි බඳුන් කැබැල්ලක වක්වූ පැත්ත යටට සිටිනසේ තමා තබා ඒ මත කුඩා උළු හෝ ගඩොල්කැට තට්ටුවක් අතුරා ගත යුතුය. ඉන් පසු දිරා ගිය කොළරොඩු තට්ටුවක් අතුරා බඳුනෙන් තුන්කාලක් තරම් පිරෙන තෙක් ඉහත දැක්වූ වගා මාධ්‍යය පුරවා ගැනීම කළ යුතුය. ඉන්පසු පැළය බඳුන තුළ රෝපණය කර ගැට්ටේ සිට අඟල් 1/2 ක් පමණ ඉතිරිවන තෙක් වගා මාධ්‍යය නැවත පුරවාගත යුතුය. සකස්කරගත් බඳුන්වලට හොඳින් ජලය දමා තද සෙවනැති තැනක දින කීපයක් තැබීම අවශ්‍යවේ.

පත්‍රික ඇන්තුරියම් වගාවේදී ඒවාට ඇතිවිය හැකි කෘමි උවදුරු වළක්වා ගැනීම ඉතා වැදගත්වේ. විශේෂයෙන් පත්‍රවලට හානි කරන කෘමීන් නිසා ශාකයේ අලංකාරය අඩුවී යනු ඇත. කොළ කන දළඹුවන්, ගොළුබෙල්ලන් හා හංගොල්ලන්, කොරපොතු කෘමීන්, පිටිමකුණන් හා වේයන් මේ අතර ප්‍රධාන තැනක් ගනී. සුදුසු කෘමිනාශක යොදා ගෙන එම සතුන් මර්දනය කිරීම අවශ්‍යවේ.

අලංකාරය සඳහා ගෙවත්තේ වගාකර ගත හැකි පත්‍රික ඇන්තුරියම් වර්ග කීපයක් ඇත.



**ක්වීන් ඇන්තුරියම්**
**(Anthurium waracaquanum)**

මෙහි පත්‍ර අඩි තුනක් පමණ දිගැති විශාල ඒවාවේ. තද කොළ පැහැති පත්‍ර මතුපිට විල්ලුද වැනි ස්වභාවයක් ඇති බැවින් එහි අලංකාරය වැඩිවී ඇත. සුදු පැහැති නාරටි රටාව කැපී පෙනේ.

**ක්‍රිස්ටල් ඇන්තුරියම්**
**(Anthurium crystallinum)**

හදවතෙහි හැඩය ගන්නා විශාල පත්‍රවල දිළිසෙන කොළ පැහැයක් ඇති අතර කැපී පෙනෙන නාරටි රටාව නිසා සිත් ඇදගන්නා පෙනුමක් ඇත.

**බර්ඩ්ස් නෙස්ට් ඇන්තුරියම්**
**(Anthurium hookeri)**

කුරුළු කැදැල්ලක පෙනුම මැද දිස්වනසේ දිගු පත්‍ර විහිදී පවතී. පත්‍රවල දෙකෙළෙවර සිහින් වන අතර මැද මහතින් වැඩිය.

**රෝයල් ඇන්තුරියම්**
**(Anthurium regale)**

අළුකොළ පැහැයක් ගන්නා විශාල පත්‍ර සහිත මෙම වර්ගයේ පත්‍ර මත රිදීමය නාරටි පැහැදිලිවම පෙනේ. පත්‍ර හැඩය හෘදකාරය.

**කිං ඇන්තුරියම්**
**(Anthurium veitchii)**

ශාක පත්‍ර හදවතක හැඩය ගන්නා මෙය අඩි තුනක් පමණ දිග විශාල ඒවාවේ. පත්‍රය මතුපිට රැළි වැටුන ස්වභාවයක් ඇත. මැදි නාරටිය කැපී පෙනෙන අතර ශාඛා නාරටි ගිලී පවතී.

තිසි පමණට අවධානය යොමු කර වගා කර ගත්විට එම පැළවලින් මතුවන පඳුරු තුළ ඇති පැළ වෙන්කර නැවත වගා කර ගත හැකි අතරම මල් පරාගනයෙන්ද අලුත් පැළ ලබා ගත හැකිය. එයටම සුවිශේෂ වූ අලංකාර පෙනුමක් ඇති පත්‍රික ඇන්තුරියම් පැළ කීපයක් වත් ඔබේ ගෙවත්තේ වගාකර ගන්නේ නම් එමගින් ගෙවත්තට අලංකාර මෙන්ම වඩා වැදගත් පෙනුමක් ලබා දීමට හැකි වනු ඇත.

**තිලක් ගමගේ**